විශ්වවිද්‍යාල ගිණුම් ඉදිරිපත් කිරීමේදී සාමාන්‍යයෙන් බැඳී සිටින්නාවූ පිළිගත් ගිණුම් ක්‍රම මූලධර්ම ක්‍රමෝපායන්, ප්‍රමිතීන්, උපකල්පන, පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සමාහරණ සංකල්ප, උපචිත බව, විශ්වාසනීයත්වය යන කරුනු පිළිබඳව අවධානය යොමු කරමින් ගිණුම් ඉදිරිපත් කිරීම හා අර්ථකථනය කිරීම සිදුකර ඇත.

2013 වසර සඳහා ගිණුම් ප්‍රකාශයේ විශේෂයෙන් සටහන් කිරීමට සිදුවන වැදගත් සංඛ්‍යා සටහන් පහත දැක්වේ.

I. පහත දක්වා ඇති පරිදි 2013 වසර සඳහා පුනරාවර්ථන වියදම්, ශිෂ්‍යාධාර ගෙවීම්, මහපොල හා ගොඩනැඟිලි, උපකරණ, මූලධන වත්කම් පුනරුත්ථාපනය වෙනුවෙන් රජයේ මුළු ප්‍රතිපාදන රුපියල් මිලියන 1,316,444 ක් විය.

| | |
|---|---|
| පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. මිලියන 776.850 |
| මහපොල ශිෂ්‍යත්ව සඳහා රජයේ ප්‍රතිපාදන | රු. මිලියන 4.806 |
| මහපොළ භාරකාර අරමුදලේ ප්‍රතිපාදන | රු. මිලියන 29.366 |
| ශිෂ්‍යාධාර ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. මිලියන 24.101 |
| මූලධන වත්කම් පුනරුත්ථාපන- ප්‍රාග්ධන 101 | රු. මිලියන 50.000 |
| ඉඩම් හා ගොඩනැඟිලි මිලදී ගැනීම- ප්‍රාග්ධන 103 | රු. මිලියන 381.321 |
| ඉගැන්වීම් හා විද්‍යාගාර උපකරණ, කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ, පොත් සහ වාර සඟරා - ප්‍රාග්ධන 102 | රු. මිලියන 50.000 |
| **එකතුව** | **රු. මිලියන 1,316.444** |

II. ක්ෂය හා පාරිතෝෂික ප්‍රතිපාදන ඇතුලත්ව විශ්වවිද්‍යාලය සඳහා 2012 වසරේදී ආදායමට වඩා වියදම රුපියල් මිලියන 19.356 ක් විය.

III. අර්ථසාධක අරමුදලේ ණය හැර විශ්වවිද්‍යාලයේ සේවකයන්ට හා වෙනත් අයට ගෙවන ලද ණය හා අත්තිකාරම් ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කල දිනට රුපියල් මිලියන 26.683 ක් විය. සේවකයන් සඳහා බැංකු ණය හා සේවක අරමුදල් ණය අර්ථසාධක අරමුදල් සුරකුම මත ලබාදී ඇත. අර්ථසාධක අරමුදලෙන් ලබා දී ඇති ණය විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ උපදෙස් මත ගිණුම් පොත් වලින් ඉවත් කර ඇති අතර, ඔවුන්ගේ (දේපළ) ඇපයට තබා වසර 15 ක කාල පරිච්ඡේදයකින් අයකර ගැනිම සඳහා විශ්ව විද්‍යාලයේ නිරිදේශ මත සේවකයින් සඳහා රාජ්‍ය බැංකුවලින් මිලියන 1.00 සිට මිලියන 2.00 දක්වා වෙනත් බැංකු ණය ලබා දි ඇත. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අදාළ ණය මුදලේ පොළි අනුපාතයෙන් අඩක් ගෙවනු ලබයි.

IV. මිහින්තලේ රජරට විශ්වවිද්‍යාලයේ මුළු ආයෝජන වල වටිනාකම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කල දිනට රු. මිලියන 77.883 ක් විය.

V. මිහින්තලේ රජරට විශ්වවිද්‍යාලයේ වෙනත් සම්පත් වල ආදායම වසර අවසානයේ මූල්‍ය ප්‍රකාශය පිළියෙල කල දිනට රු. මිලියන 18.813 ක් විය

VI. මිහින්තලේ රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනයේ දක්වාඇති පරිදි ස්ථාවර වත්කම් මුළු වටිනාකම රු. මිලියන 2758.879 ක් විය.

VII. පැවැත්ම හා හිමිකාරිත්වය තහවුරු කිරීම සඳහා ගබඩා භෞතිකව ප්‍රත්‍යක්ෂ කිරීමෙන් අනතුරුව, මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සඳහන් තොග වටිනාකම රු. මිලියන 28.024 ක් වූ අතර තොග අයිතමයන් සඳහා අයිතම් වටිනාකම ඇතුලත් වන ආකාරයෙන් ගිණුම් වාර්තා පවත්වාගෙන යන ලදි.

VIII. විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ඉතිරිය රු. මිලියන 27.676 ක් විය. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලයට එකී දින වන විට උපචිත වියදම් හා වගකීම් තිබූ අතර, ගිණුම් පියවීමට පෙර ප්‍රතිපාදන ලබා ගෙන තිබූ නිසා, එය පියවීමට හැකිවී තිබුණි.

IX. විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් වල අවසාන ශේෂයන් මූල්‍ය ප්‍රකාශය හා අදාල මුදල් පොත් සමඟ සසඳා ඇති අතර, බැංකු වල තහවුරු කිරීම් සෘජුව විගණනයට යැවීමට අදාල බැංකු වලින් ඉල්ලීම් කරන ලදි.

| | | |
|---|---|---|
| මහාචාර්යය කේ.එච්.ආර්.විජේවර්ධන<br>උපකුලපති | ඒ.ජී. කරුණාරත්න මහතා<br>ලේඛකාධිකාරි | ආර්.එම්.දසනායක<br>මූල්‍යාධිකාරි |

## 2013 වසර සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ගිණුම් ප්‍රකාශය සටහන්

සාමාන්‍ය සටහන්

(අ) වසර සඳහා රජයේ ප්‍රතිපාදන ලබා ගැනීම, අභ්‍යන්තර සම්පත් තුළින් ආදායම් උත්පාදනය හා වියදම උපචිත පදනමින් වාර්තා කරන ලදි.

(ආ) වර්තමාන වටිනාකම, පැවැත්ම, හිමිකාරිත්වය නිශ්චය කිරීම සඳහා පෙර පිවිසි, පෙර නිකුත් ක්‍රමය පදනම්කරගෙන ද්‍රව්‍ය තොග භෞතිකව තක්සේරු කිරීම සිදුවන අතර, තොග ද්‍රව්‍ය සඳහා ගිණුම් වාර්තා පවත්වාගෙන යාම මූල්‍ය තත්ව දිනට සිදු කර ඇත.

(ඇ) මේ අනුව, වියදම් විශ්ලේෂනය, වියදම් වැඩසටහන්, ව්‍යාපෘති හා දෙපාර්තමේන්තු පදනමින් විශ්ලේෂණය කර ඇති අතර, වැය ශිර්ෂ අනුව ගිණුම් ප්‍රකාශයේ පෙන්වා ඇත.

(ඈ) රජරට විශ්වවිද්‍යාලය භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගනිමින් පුනරුත්තාපන වැඩසටහන යටතේ රු. මිලියන 50.00 ක් වියදම් කර ඇත.

(ඉ) ව්‍යාපෘති වල ස්වභාවය අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා භාණ්ඩාගාරයේ මුලධර්ම හා ක්‍රම අනුගමනය කරමින් පුනරුත්ථාපන ව්‍යාපෘතිය ගිණුම් ගත කිරීම සිදුකර ඇත.

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ව ප්‍රකාශය පිළිබඳ ගිණුම් සටහන

(අ) අදාල වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ ගොඩනැඟිලි, උපකරණ හා මූලධන වත්කම් පුනරුත්තාපනය සඳහා ලැබුණු මුළු මූලධන ආධාර රු. මිලියන 511 ක් විය. කෙසේ වෙතත් භාණ්ඩාගාර විසින් ප්‍රතිපාදන සීමා කිරීම නිසා සම්පූර්ණ ප්‍රතිපාදන නිදහස් කර ගැනීම අපට නොහැකි විය.

(ආ) කේවල ගිණුම් සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනය සඳහා සවිස්තරාත්මක ලේඛනයක් වෙන්වෙන්ව සකසා ඇත.

(ඇ) ස්ථාවර වත්කම් පහත සඳහන් පිරිවැය අනුපාතයන් යටතේ ක්ෂය කර ඇත.

| | |
|---|---|
| ගොඩනැඟිලි | 5% |
| යන්ත්‍රෝපකරණ හා සවි කිරීම | 20 % |
| ගෘහභාණ්ඩ හා සවිකිරීම් | 10% |
| කාර්යාල උපකරණ | 20% |
| සන්නිවේදන උපකරණ | 20% |
| තොරතුරු තාක්ෂණ උපකරණ | 20% |
| විද්‍යාගාර හා ඉගැන්වීමේ උපකරණ | 20% |
| ලෝගු හා මල්මාල | 20% |
| ක්‍රීඩා උපකරණ | 20% |

පුස්තකාල පොත් හා වාර සඟරා මෝටර් රථ හා පශු සම්පත් ප්‍රත්‍යාගණනය කල නොහැකි විය. පිරිවැය හා ක්ෂය කිරීම් අගයන් මත ශේෂ පත්‍රයේ දක්වා තිබේ

| | |
|---|---|
| පුස්තකාල පොත් සහ වාරසඟරා | 20% |
| මෝටර් රථ | 20% |
| පශුසම්පත් | 20% |

2013 වසර සඳහා ක්ෂය වෙනුවෙන් රුපියල් මිලියන 186.046 ක් සපයා තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂය රුපියල් මිලියන 580.809 ක් විය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 649 ප්‍රකාරව, මිලදී ගැනීම් හා බැහැර කිරීමේ මාසික පදනම මත වත්කම් ක්ෂය කරනු ලැබේ. ප්‍රත්‍යාගණන ගිණුම් ගැලපීම ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සිදුකර ඇත.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 අනුව, ශේෂ පත්‍රය ගනනය කරන දින වන විට ඇස්තමේන්තුගත ඒකක බැර ක්‍රමය භාවිත කරමින් රු. මිලියන 2.585 ක් 2013 වසර සඳහා පාරිතෝෂික ගෙවීම වෙනුවෙන් සපයා තිබුණි. 2013.12.31 දින වන විට පාරිතෝෂික සඳහා සමුච්චිත ප්‍රතිපාදන රු. මිලියන 26.475 කි. පාරිතෝෂික වගකීම භාහිරව අරමුදල් හෝ ආයුෂ වටිනාකමින් නොවේ.

(ඉ) 2010 වර්ෂය තුළ විශ්වවිද්‍යාලය මඟින් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සහිතව මූල්‍ය කල්බදු පහසුකම් යටතේ රු. මිලියන 14.40/- ක පිරිවැයකින් යුත් වාහන මිලදී ගනු ලැබුණි.රු.මිලියන 2.798 ක් කල්බදු ණය හිමියන් ලෙස ගිණුම්වල රඳවා ඇත.

(ඊ) විගණකාධිපතිවරයා පසුගිය වාර්තාවෙන් ලබා දී තිබූ උපදෙස් පරිදි, වෛද්‍ය, ව්‍යවහාරික විද්‍යා හා කෘෂිකර්ම පීඨවල වර්තමානයේ ඇති රසායනික ද්‍රව්‍යවල වටිනාකමද ගණනය කර ඇත. 2013.12.31 දිනට භෞතික රසායන තොග වටිනාකම රු. මිලියන 10.837 ක් වේ.

(උ) පාරිතෝෂික ගෙවීම්, වියදම් ණය හිමියන් හා වගකීම් වෙනුවෙන් ප්‍රතිපාදන ඇතුලත්ව විශ්ව විද්‍යාලය සඳහා 2013 වසරේදී ආදායම මත වියදමේ ඉක්මවීම රු. මිලියන 19.356 ක් විය. ආදායම මත වියදම් ඉක්මවීමේ( හිඟය) සාරාංශය පහත පරිදි දැක්වේ.

| | |
|---|---|
| ආදායම මත වියදමේ ඉක්මවීම | රුපියල් මිලියන 19.356 |
| අඩුකලා පහත දැක්වෙන ප්‍රතිපාදන | |
| පර්යේෂණ හා සංවර්ධන | රුපියල් මිලියන7.000 |
| කාර්යය මණ්ඩල පාරිතෝෂික ගෙවීම් | රුපියල් මිලියන 2.585 |
| සම්මුච්චිත වියදම් සඳහා ප්‍රතිපාදන | රුපියල් මිලියන 48.272 |
| මුළු වියදම. | රුපියල්. මිලි.57.857 |
| වාර්ෂික හිඟය | රුපියල්.මිලි 38.00 |

(ඌ) 2013 මුල්‍ය වසර අවසානයේදී ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් රුපියල් මිලියන 527.979 ක මුදලක් වැය කර ඇත. භාණ්ඩාගාරය මෙහෙයුම් මඟින් අරමුදල් ආපසු ගැනීම අඩුරා තැබීම නිසා රු. 50.00 ක වටිනාකමැති බිල්පත් නිරවුල් කිරීමට නොහැකි විය. කෙසේ වෙතත් 2014.01.23 දින එකී රු.මි. 50.00 ක මුදල විශ්වවිද්‍යාලය වෙත ලබා දෙන ලදී.

(ඒ) දැයට කිරුළ වැඩසටහන යටතේ ගොඩනැගිලි කොන්ත්‍රත් කරුවන්ගේ හදිසි බැඳීම් ඉටුකිරීම වෙනුවෙන් ලංකා බැංකුව මිහින්තලය ශාඛාවෙන් රුපියල් මිලියන 25.00 ක මුදලක් විශ්ව විද්‍යාලය විසින් ණයට ගන්නා ලදි රු. මිලියන 30.00 වටිනාකමින් යුත් ස්ථාවර තැන්පත් සුරැකුම් මහ බැංකුව විසින් ඇපයට තබාගෙන ණය මුදල ලබා දෙන ලදි. ස්වයං මුල්‍ය ව්‍යාපෘති අරමුදලට අදාලව 2.0% අමතර වාර්ෂික පොලියක් අයකරන ලදි. මෙම ණය මුදල මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ අවසන් දින වන විට සම්පූර්ණයෙන් පියවා තිබුණි.

මහාචාර්යය කේ.එච්.ආර්.විජේවර්ධන
උපකුලපති

ජේ.ජී. කරුණාරත්න මහතා
ලේඛකාධිකාරි

ආර්.එම්.දසනායක
මූල්‍යාධිකාරි

## මිහින්තලය ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය
## 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

| විස්තරය | උප ලේඛන අංකය | පිටු අංකය | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|---|
| **වත්කම්** | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| ස්ථාවර වත්කම්(WDV) | 1 | 12 | 2,757,147,939 | 2,587,986,154 |
| ස්ථාවර වත්කම් කෙරිගෙන යන වැඩ | 2 | 14 | 1,297,678,869 | 1,068,495,302 |
| | | | **4,054,826,808** | **3,656,481,456** |
| **ජංගම වත්කම්** | | | | |
| තොගය | 3 | 15 | 28,024,162 | 25,191,312 |
| විවිධ ණයගැතියෝ - විවිධ | 4 | 15 | 5,865,785 | 7,268,837 |
| විවිධ අත්තිකාරම් | 5 | 15 | 4,912,296 | 2,627,529 |
| සැපයුම් හා සේවා අත්තිකාරම් | 6 | 16 | 12,343,330 | 2,748,587 |
| පෙර ගෙවීම් | 7 | 16 | 1,729,825 | 3,928,807 |
| **මූල්‍ය වත්කම්** | | | | |
| කාර්ය මණ්ඩල සඳහා ණය හා අත්තිකාරම් | 8 | 16 | 26,688,129 | 24,070,311 |
| ආයතන වලින් අයවිය යුතු මුදල් | 9 | 16 | 2,338,800 | 2,466,300 |
| ජංගම අත්තිකාරම් | 2 | 14 | 50,307,692 | 116,288,754 |
| ආයෝජන අරමුදල් සීමා කිරීම | 10 | 17 | 77,883,373 | 31,655,260 |
| වෙනත් ආයෝජන | 10 | 17 | 80,229 | 85,301 |
| බැංකුවේ මුදල් ශේෂය | 11 | 18 | 27,676,583 | 17,495,946 |
| | | | **237,850,202** | **233,826,945** |
| | | | | |
| **මුළු වත්කම්** | | | **4,292,677,010** | **3,890,308,401** |
| අඩුකලා- වගකීම් | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| පරිත්‍යාග අරමුදල් | 12 | 19 | 2,427,393 | 1,294,186 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 13 | 19 | 26 ,475,106 | 24,774,273 |
| පරියේෂණ ප්‍රතිපාදන | 14 | 19 | 11,467,078 | 22,305,542 |
| වෙනත් අරමුදල් | 15 | 20 | 102,852,543 | 91,417,672, |
| කල්බදු ණය හිමියෝ | 16 | 21 | - | 2,160,000 |
| | | | **143,222,120** | **141,951,673** |
| **ජංගම වගකීම්** | | | | |
| විවිධ ණය හිමියෝ | 17 | 21 | 73,933,009 | 62,216,108 |
| තැන්පත් | 18 | 22 | 70,360,467 | 51,303,564 |
| වියදම් ණය හිමියෝ | 19 | 22 | 48,272,145 | 24,047,220 |
| කල්බදු ණය හිමියෝ | 16 | 21 | 2,160,000 | 3,396,667 |
| වෙනත් ගෙවිය යුතු මුදල් | 20 | 22 | 331,496 | 261,476 |
| | | | **195,057,117** | **141,225,036** |
| | | | | |
| **මුළු වගකීම්** | | | 338,279,237 | 283,176,709 |
| | | | | |
| **මුළු දළ වත්කම්** | | | **3,954,397,773** | **3,607,131,692** |

| විස්තරය | උප ලේඛන අංකය | පිටු අංකය | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|---|
| **ශුද්ධ වත්කම්/ හිමිකම්** | | | | |
| ප්‍රාග්ධන- වැයවූ මූලධන ප්‍රතිපාදන | | | 1,829,327,708 | 1,651,233,894 |
| ප්‍රාග්ධන- වැයවූ ප්‍රතිපාදන/ කෙරිගෙනයන වැඩ | 2 | 14 | 1,347,986,560 | 1,184,784.057 |
| වැයනොවූ මූලධන ප්‍රතිපාදන - | 21 | 23 | (67,220,065) | (72,787,777) |
| ඉඩම් හා ගොඩනැගිලි මිලදී ගැනීම ප්‍රත්‍යාගණන අතිරික්තය | | | 830,827,745 | 830,827,745 |
| | | | **3,940,921,948** | **3,594,057,919** |
| **විශේෂිත සංචිත** | | | | |
| වැයනොවූ මූලධන ආධාර, උපකරණ ගෘහ භාණ්ඩ, පුස්තකාල පොත් හා වාහන | 21 | 23 | (29,055,348) | (20,169,480) |
| විශේෂ ප්‍රදාන වත්කම් | | | | |
| | | | **(29,055,348)** | **(20,169,480)** |
| **පුනරුත්ථාපන** | | | | |
| පුනරුත්ථාපන- වැයවූ ප්‍රතිපාදන | | | | |
| පුනරුත්ථාපන- වැය නොවූ ප්‍රතිපාදන | 21 | 23 | (15,612,698) | (1,951,279) |
| පරිත්‍යාග(වත්කම්) | | | | |
| විදේශ ආධාර | 22 | 25 | 153,320,333 | 153.320,333 |
| | | | **137,707,635** | **151,369,054** |
| **සංචිත** | | | | |
| විශේෂ සංචිත | 23 | 25 | 18,623,758 | 17,127,994 |
| ආයතනයේ පොදු සංචිත | | | (113,800,220) | (135,253,795) |
| | | | (95,176,463) | (118,125,801) |
| මුළු දළ වත්කම්/ හිමිකම් | | | **3,954,397,773** | **3,607.131,692** |

නිවැරදි බවට සහතික කලේ,

මහාචාර්යය කේ.එච්.ආර්.විජේවර්ධන
උපකුලපති

ජ්.ජී. කරුණාරත්න මහතා
ලේඛකාධිකාරී

ආර්.එම්.දසනායක
මූල්‍යාධිකාරී

## ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
## 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය යටතේ)

| | 2013 | 2012 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | (රුපියල්) | (රුපියල්) |
| මෙහෙයුම් අතිරික්තය/ ඌණතාවය | (18,154,193.89) | (24,064,636.86) |
| <u>ගැලපීම්</u> | | |
| ක්ෂය | 186,046,479.40 | 180,027,100.00 |
| පාරිතෝෂික සඳහා වෙන් කිරීම් | 2,585,647.01 | 2,707,147.39 |
| වාහන ලීසින් පොළී | 1,101,610.27 | |
| පොදු සංචිත හා වෙනත් ගැලපීම් | 39,607,769.41 | |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ලියා හැරීම් | (186,046,479.40) | (176,257,079.41) |
| | **25,140,832.80** | **17,587,468.88** |
| තොග වැඩිවීම් | (2,832,849.70) | 950,865.85 |
| ණය ගැතියෝ වැඩිවීම | (11,593,378.76) | (2,763,579.31) |
| පෙරගෙවුම් අඩුවීම් | 2,198,981.98 | 1,853,690.45 |
| වෙළඳ ණය හිමියෝ වැඩිවීම් | 36,011,845.32 | 21,888,031.68 |
| තැන්පතු අඩුවීම් (වැඩිවීම්) | 19,056,902.74 | (14,309,934.76) |
| මෙහෙයුම් ක්‍රියාකාරිත්වයෙන් ලද මුදල් ප්‍රවාහය | **67,982,334.38** | **(9,968,394.98)** |
| පාරිතෝෂිත ගෙවීම් | (884,813.88) | (1,924,292.00) |
| **මෙහෙයුම් ක්‍රියාකාරිත්වයෙන් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | **67,097,520.50** | **(11,892,686.98)** |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය** | | |
| දේපල පිරියත උපකරණ අත්තිකාරම් | (149,714,839.00) | (236,829,139.42) |
| කෙරීගෙන යන වැඩ සඳහා ගෙවීම් | (368,695,928.00) | (290,646,110.00) |
| ස්ථාවර තැන්පතු ආයොජන | (49,276,629.97) | 28,973,861.58 |
| වෙනත් | (2,612,746.15) | |
| ස්ථාවර තැන්පතු වලින් ලද පොලී | 3,048,515.52 | 2,145,940.00 |
| **ආයෝජන ක්‍රියාකාරිත්ව යේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | (567,251,627.60) | (496,355,447.84) |
| **මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | | |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන ලැබීම් | 460,363,221.00 | 428,611,032.29 |
| පුනරුත්තාපන ප්‍රතිපාදන ලැබීම් | 50,000,000.00 | 45,500,000.00 |
| පර්යේෂණ හා වෙනත් අරමුදල් වල වැඩිවීම් | 3,225,377.53 | 17,754,430.93 |
| වාහන මූල්‍ය කල්බදු සඳහා ගෙවීම් | (4,498,277.00) | (8,331,564.00) |
| ඇප බැදුම්කර කඩ වීමෙන් ලද මුදල් | 1,244,422.49 | 597,884.15 |
| **මූල්‍ය ක්‍රියාකාරීත්ව යේ ශුද්ධ මුදල් ප්‍රවාහය** | 510,334,744.02 | 484,131,783.37 |
| **ශුද්ධ මුදල් ප්‍රවාහය** | **10,180,636.92** | **(24,116,351.45)** |
| **2013.01.01 දිනට මුදල්** | 17,495,946.08 | 41,612,297.59 |
| **2013.12.31 දිනට මුදල්** | 27,676,583.00 | 17,495,946.08 |
| | **10,180,636.92** | **(24,116,351.51)** |



මහාචාර්ය රංජිත් විජයවර්ධන
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

# 2013 වර්ෂයේ අවසන් ගිණුම් ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } NC/AP/E/RUSL/01/13/10
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2015 ජනවාරි 23 දින


උපකුලපති,

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

පිටපත්:- 1. ලේකම් - මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය

2. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. NC/AP/E/RUSL/01/13/10 ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2015 ජනවාරි 23 දින

උපකුලපති,

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත 2014 ඔක්තෝම්බර් 10 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - –1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරිවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම, විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------------

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට පටහැනි වීම

-----------------------------------------------------------------

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 අනුව ආදායමින් වියදම් හිලව් නොකළ යුතු වුවද රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබූ ණය මුදලකට අදාලව සමාලෝචිත වර්ෂයේ ගෙවූ පොළී රු.491,738 ක් ආයෝජන ආදායමට එරෙහිව කපා හැර තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විශ්වවිද්‍යාලය සතු අක්කර 220 කට අධික ඉඩම්වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාකරන ස්වයං උත්පාදන ව්‍යාපෘති වෙත ලැබෙන මුදල් ආයෝජනය කිරීමෙන් ලද රු.4,518,078 ක් විශ්වවිද්‍යාලයේ ආයෝජන ආදායම් ලෙස හඳුනාගැනීම වෙනුවට එම ව්‍යාපෘති ගිණුම්වලට බැරකර තිබුණි.

(ඇ) පර්යේෂණ වියදම් වෙනුවෙන් අයවැය මගින් වෙන්කරන සම්පූර්ණ මුදල වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීමේ ප්‍රතිපත්තිය විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ සත්‍ය පර්යේෂණ වියදම රු.4,183,432 ක් වුවත් වෙන්කළ සම්පූර්ණ මුදල වූ රු.7,000,000 ක් වියදමක් ලෙස දක්වා තිබුණි. වර්ෂයක් පාසා මෙයින් වැයකර ඉතිරිවන මුදල පර්යේෂණ ප්‍රදාන අරමුදල් ගිණුමේ ශේෂය ලෙස ඉදිරියට ගෙනවිත් තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අවසානයට එම ශේෂය රු.11,467,078 ක් විය.

(ඈ) විශ්වවිද්‍යාලය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට අදාලව වැඩපූර්ව අත්තිකාරම් ලබා දී පසුව ගෙවීම් කරන ලද බිල්පත්වලින් අත්තිකාරම් නිරවුල් කර තිබුණද එය ජ'නල් සටහන් මගින් ගිණුම්වලට ගැලපීම් කර නොතිබීම හේතුවෙන් වැඩපූර්ව අත්තිකාරම් ගිණුම රු.2,065,676 ක් වැඩියෙන් හා කෙරීගෙන යන වැඩ ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඉ) වත්කමක් පාවිච්චියට සුදුසු තත්ත්වයකට පත්කළ අවස්ථාවේ සිට එහි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා ක්‍රමානුකූලව ක්ෂය කළයුතු නමුත්, රු.47,132,633 ක පිරිවැයකින් ඉදිකරන ලද ජල ව්‍යාපෘතිය සඳහා ඉකුත් වර්ෂ 02 වෙනුවෙන් රු.4,713,263 ක් ක්ෂය ප්‍රතිපාදන සිදු කර නොතිබුණි.

2.2.3 නොසැසඳු පාලන ගිණුම්

(අ) මහාචාර්යවරයෙකුගේ නමින් ඇති පරිත්‍යාග අරමුදල් (Endowment Fund) ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශනවල උපලේඛනයේ රු.52,625 ක් ලෙස සටහන් කර තිබුණු නමුත් එය ලෙජර් ගිණුමේ රු.102,625 ලෙස දක්වා තිබීමෙන් රු. 50,000 ක වෙනසක් නිරීක්ෂනය විය.

(ආ) පෞද්ගලික ලිපිගොනු අනුව විශ්වවිද්‍යාලයේ ගිවිසුම් කඩකරන ලද ආචාර්යවරුන් දෙදෙනෙකුගෙන් 2013 දෙසැම්බර් 31 දිනට අය විය යුතු මුදල රු.1,354,676 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු. 1,538,421 ක් ලෙස දක්වා තිබුණි.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කෘෂිකර්ම පීඨයට අයත් රු. 82,270 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පශු සම්පත්වල වටිනාකම හා භෞතික පැවැත්ම සනාථ කිරීමට අවශ්‍ය ලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂයේ අධ්‍යයන කාර්යය මණ්ඩල සඳහා ගෙවූ රු.26,944,235 ක් වූ පර්යේෂණ දීමනාවලට සම්බන්ධ විගණන විමසුමකට පිළිතුරු ලබාදී නොතිබුණු අතර ගෙවීම්වල නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

### 2.3 ලැබිය යුතු ගිණුම්

වර්ෂ 01 සිට වර්ෂ 06 දක්වා කාලයක සිට නොපියවා ඇති එකතු වටිනාකම රු.75,000 ක් වූ පර්යේෂණ අත්තිකාරම් ශේෂ 02 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයවී නොතිබුණි.

### 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විශ්වවිද්‍යාලයේ පරිගණක ගත කරනලද ස්ථාවර වත්කම් ලේඛනය 2010 දෙසැම්බර් 31 දින දක්වා පමණක් යාවත්කාලීන කර තිබීම හේතුවෙන් 2011 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා ගිණුම් වලට ඇතුළත් කර තිබූ රු.1,804,302,726 ක් වටිනා ස්ථාවර වත්කම් විෂයයන් 15 ක් විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

(i) මුදල් රෙගුලාසි 772(1)

2013 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මඟින් හඳුනාගන්නා ලද විෂයයන් 76 කට අයත් භාණ්ඩ අයිතම 1230 ක් සුදුස්සක් කොට බැහැර කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 1645 (ආ) සහ 1646

සමාලෝචිත වර්ෂයට අදාල වාහන ධාවන සටහන් හා වාහන ලොග් සටහන් පොත් විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ආදායම් ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණු ඉන්ධන වියදමෙන් රු.7,478,277ක් හා වාහන නඩත්තු වියදම රු. 4,436,025 ක් සතුටුදා ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

2.5 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපකුලපති නිල නිවස වටා තාප්පයක් ඉදිකිරීම සඳහා පිළියෙල කළ විශ්වවිද්‍යාලයේ ඇස්තමේන්තු වටිනාකම රු.8,006,455 ක්ද එම ව්‍යාපෘතිය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ලැබී තිබූ සුදුසුකම්ලත් අවම මිල ගණන් රු.8,013,185 ක් වුවද ඇස්තමේන්තු මිල හා අවම මිල ගණන් නොසලකා රු.9,630,623 ක් මිල ගණන් ඉදිරිපත්කළ වෙනත් කොන්ත්‍රාත්කරුවකුට ඉදිකිරීම් ව්‍යාපෘතිය පිරිනැමීම හේතුවෙන් විශ්වවිද්‍යාල අරමුදලට රු.1,617,438 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සතුව ඉංජිනේරුවරු දෙදෙනෙකු ඇතුළුව ඉංජිනේරු කාර්ය මණ්ඩලයකින් සමන්විත ඉංජිනේරු අංශයක් තිබියදී උපකුලපති නිල නිවස වටා තාප්පයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ උපදේශන සේවා ලබාගැනීමට ඇස්තමේන්තු අගයෙන් සියයට 5.5 ක් උපදේශන ගාස්තු ගෙවීමට එකඟ වී තාප්පය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ උපදේශක සේවා ලබාගැනීම සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට එම කටයුතු පවරා තිබුණි.

(ඇ) උපකුලපති නිල නිවස වටා තාප්පයක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාල කොන්ත්‍රාත් ලියකියවිලිවල ඇතුළත් සම්මත ලංසු ආකෘතිපත්‍රවල දක්වා ඇති පරිදි වැඩ නිමකිරීමට ප්‍රමාද වන දිනක් සඳහා කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 0.05 ක් සහ උපරිමය සියයට 10 ක් වන පරිදි ප්‍රමාද ගාස්තු අයකළ යුතු වුවද ගිවිසුම් ගත වැඩ නිමකළයුතු දින සිට 2014 ඔක්තෝබර් 21 දින වන විට ප්‍රමාදය දින 200 ක් ඉක්මවා ඇති බැවින් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 ක් එනම් රු.963,062 ක් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබූ අතර කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමටද කටයුතු කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවලින් රු.18,154,195 ක ඌනතාවයක් ඇති වී තිබුණු අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.24,064,637 ක් වීමෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.5,910,442 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ බාහිර පාඨමාලාවල ආදායම රු.36,970,653 කින් වැඩිවීම වර්ධනයට ප්‍රධාන වශයෙන් ප්‍රධාන හේතුවී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්යසාධනය පහත පරිදි වේ.

4.1 (අ) විභාග ප්‍රතිඵල

2013 වර්ෂයේදී පැවැත් වූ අවසන් වසර විභාගය හා උපාධිය සමත්වීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | ව්‍යවහාරික විද්‍යා පීඨය | කෘෂිකර්ම විද්‍යා පීඨය | කළමනා කරණ අධ්‍යයන විද්‍යා පීඨය | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් වසර විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 204 | 88 | 344 | 464 | 230 | 1330 |
| පන්ති සාමාර්ථ සහිතව සමත් සංඛ්‍යාව | 74 | 61 | 32 | 409 | 69 | 645 |
| සාමාන්‍ය සමත් සංඛ්‍යාව | 103 | 20 | 233 | 29 | 130 | 515 |
| මුළු සමත් සංඛ්‍යාව | 177 | 81 | 265 | 438 | 199 | 1112 |
| අසමත් සංඛ්‍යාව | 204 | 07 | 79 | 26 | 31 | 170 |
| විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් උපාධිය අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතය | 13.23 | 7.9 | 22.9 | 5.6 | 13 | 12.5 |

i) සමාලෝචිත වර්ෂය තුළදී පීඨ 05 ක අවසන් වසර විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 1330ක් වූ අතර එයින් ශිෂ්‍යයන් 170 දෙනෙකු විභාගයෙන් අසමත්වී තිබූ අතර එය විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 12.7 ක් විය.

ii) සමාලෝචිත වර්ෂයේ සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨයේ සහ කළමනාකරණ අධ්‍යයන පීඨයට අදාල උපාධි පාඨමාලාවන්හි සමාසික විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීම මාස 05 සිට මාස 10 දක්වා කාල ප්‍රමාදයක් සහිතව සිදුවී තිබුණි.

iii) ව්‍යවහාරික විද්‍යා පීඨයේ සහ කෘෂිකර්ම පීඨයේ සමාසික විභාග පැවැත්වීම හා ඒවායේ ප්‍රතිඵල නිකුත් කිරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම විභාගවල ප්‍රතිඵල නිකුත්කිරීමේ කාර්යක්ෂමතාව පිළිබඳ පරික්ෂා කිරීමට නොහැකි විය.

iv) වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨයේ සියළු විභාගවලට අදාල ප්‍රතිඵල දින 11ත් දින 82ත් කාලයක් අතර නිකුත්කර තිබුණි.

(ආ) ඒක ශිෂ්‍ය පිරිවැය

සමාලෝචිත වර්ෂයේදි එක් එක් පීඨයේ මුළු පුනරාවර්තන පිරිවැය හා ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වේ.

| | කෘෂිකර්ම පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය | කළමනාකරණ පීඨය | වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය | එකතුව |
|---|---|---|---|---|---|---|
| මුළු පිරිවැය (රු.000) | 83,772,217 | 93,057,757 | 73,651.200 | 103,993,620 | 130,270,559 | 484,745,353 |
| මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | 427 | 862 | 1292 | 1731 | 1090 | 5,402 |
| ඒක ශිෂ්‍ය පිරිවැය (රු. 000) | 196,188 | 107,956 | 57,006 | 60,077 | 119,514 | 89,734 |

අනෙකුත් පීඨයන්ට සාපේක්ෂව කෘෂිකර්ම පීඨය සඳහා අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවා ගැනීම, ඒක ශිෂ්‍ය පිරිවැය ඉහළ යෑමට හේතුවී තිබුණි.

(ඇ) දේශන පැවැත්වීමේ ප්‍රගතිය

(i) විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයට අදාලව සිදුකරනු ලබන දේශන පිළිබඳව මෙන්ම අධ්‍යන කාර්යය මණ්ඩලයේ ප්‍රගතිය මැනීම සඳහාද ඇති එකම ලිඛිත සාක්ෂිය වූයේ එක් එක් දේශනයට අදාලව ශිෂ්‍යයන්ගේ පැමිණීම ලකුණු කරන ලද අත්සන් පත්‍රිකාව පමණක් වන අතර එය අංශ ප්‍රධානීන්ට හෝ පීඨාධිපති වරුන්ට එක් එක් පාඨමාලාවේ හෝ විෂයන්ට අදාලව දේශකවරුන්ගේ සමාසික ප්‍රගතිය අධීක්ෂණය කිරීමට ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් නොවන බව නිරීක්ෂණය විය. ඒ අනුව අංශ ප්‍රධානීන් හෝ පීඨාධිපතිවරුන් විසින් අධ්‍යයන කාර්යසාධනය ප්‍රමාණවත් ලෙස ඇගැයීම් කළ බවට තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ii) 2013 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම තුළ අධ්‍යයන කාර්යසාධනය පිළිබඳව භෞතික ඉලක්ක දක්වා නොතිබූ බැවින් වර්ෂ අවසානයට ඉලක්ක සපුරා ගැනීම පිළිබඳ විගණනයේදී ඇගැයීමට නොහැකි විය.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) විශ්වවිද්‍යාලය සතු අළුත්වැඩියා කර භාවිතයට ගත හැකි තත්වයක වූ වෑන් රථයක් අළුත්වැඩියා කිරීම් නොකර සමාලෝචිත වර්ෂය තුළ කුළී පදනම මත ලබාගත් වාහන වෙනුවෙන් රු.873,168 ක් යොදා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාල පරිශ්‍රයේ පිහිටා ඇති පොලිස් නිල නිවාස 40 ක් හා එම ඉඩම විශ්වවිද්‍යාලයට පවරාගැනීමට භාණ්ඩාගාරයෙන් ලබා දී ඇති රු. මිලියන 18 ක මුදල හා ඊට අදාලව ලද පොළිය සමඟ එකතුව වූ රු. මිලියන 29 ක ප්‍රතිපාදන තිබියදී එම මුදල් ගෙවා පොලිස් නිවාස පවරා ගැනීමට කටයුතු නොකර ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා පෞද්ගලික නිවාස 48 ක් කුළී පදනම මත ලබා ගැනීම වෙනුවෙන් විශ්වවිද්‍යාල අරමුදලින් සමාලෝචිත වර්ෂයේදී රු.21,318,000 ක මුදලක් නිවාස කුළී සඳහා ගෙවා තිබුණි.

(ඇ) ආපසු භාර නොදුන් පුස්තකාල පොත්

(i) ප්‍රධාන පුස්තකාලයෙන් රජරට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 56 දෙනෙකු විසින් ලබාගත් පොත් 167 ක් නියමිත දිනය ඉක්මවා මාස 06 සිට වසර 07 ක කාලයක් ගතවී ඇතත් ආපසු බාර දී නොතිබුණි.

(ii) කෘෂිකර්ම පීඨ පුස්තකාලයෙන් ආචාර්යවරු 04 දෙනෙකු විසින් ලබාගත් පොත් 11 ක් 2013 දෙසැම්බර් 31 දිනට මාස 04 සිට වසර 05 දක්වා කාලයක් ගත වී ඇතත්, ආපසු භාරදී නොතිබුණි.

4.3 නිෂ්කාර්ය වත්කම්

රාජ්‍ය බැංකු ශාඛාවක පවත්වාගෙන යන ගිණුමක රු.906,230 ක ශේෂයක් 2012 වර්ෂයේ සිට අක්‍රියව පැවතුණි.

4.4 ප්‍රමාද වූ ව්‍යාපෘති

කෘෂිකර්ම පීඨය පුළුල් කිරීමේ කටයුතු සඳහා අක්කර 15 ක පමණ ඉඩමක් අත්පත් කරගැනීම වෙනුවෙන් 2011 වර්ෂයේදී මධ්‍යම නුවරගම් පළාත් ප්‍රාදේශීය ලේකම් වෙත රු. 7,200,000 ක මුදලක් තැන්පත් කර තිබූ නමුත්, 2014 ජූනි මාසය වන විටත් අදාල පවරා ගැනීම සම්පූර්ණ කර නොතිබුණි.

4.5 කාර්යය මණ්ඩල පරිපාලනය

(අ) සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කාර්යය මණ්ඩලයේ තනතුරු 118 ක්ද අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 72 ක් ද පුරප්පාඩු පැවතුණි.

(ආ) අධ්‍යයන කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පැවතියද ඇතැම් විෂයයන් සඳහා අතිරික්තව කථිකාචාර්යවරුන් 14 ක් සිටින අතර කථිකාචාර්යවරු 35 දෙනෙකු දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව සඳහා අධ්‍යයන නිවාඩුද කථිකාචාර්යවරු දෙදෙනෙකු සප්ත වාර්ෂික නිවාඩු ලබා සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලයෙන් බැහැර වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කටයුතු සඳහා යොදවා ගැනීමට නොහැකි වූ අධ්‍යයන කාර්යය මණ්ඩල සංඛ්‍යාව 155 ක් වූ අතර, එය අනුමත කාර්යය මණ්ඩලයේ ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 52 ක් විය. පවතින අධික පුරප්පාඩු හේතුවෙන් බාහිර කථිකාචාර්යවරු 179 දෙනෙකු සඳහා දේශන ගාස්තු වශයෙන් රු.12,832,113 ක් ගෙවා එම සේවාව ලබා ගෙන තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ තථ්‍ය හා අනුමත කාර්යය මණ්ඩල ලේඛනයට අනුව 2013 වර්ෂයේ විශ්වවිද්‍යාලයේ මාණ්ඩලික නොවන තනතුරුවල පුරප්පාඩු 64 ක් පමණක් පැවති අතර එම පුරප්පාඩු නොසලකා ශ්‍රම සැපයුම් අංශය මගින් සපයාගත් ශ්‍රම සැපයුම් සේවා සඳහා පුහුණු හා නුපුහුණු කම්කරුවන් හා පරිගණක යෙදවුම් සහකාර ලෙස පුද්ගලයන් 109 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී රු.15,143,478 ක් ගෙවීම් කර තිබුණු අතර මේ සඳහා මහා භාණ්ඩාගාරයෙන්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් විධිමත් අනුමැතියක් ලබාගෙන තිබූ බවට සාක්ෂි නොතිබුණි.

4.6 උපාධි පාඨමාලා රැකියා වෙළඳපොලට ඉලක්ක ගතව සංශෝධනය නොවීම

විශ්වවිද්‍යාලයේ වර්ෂ 06 සිට වර්ෂ 17 දක්වා කාලයක් තුළ උපාධි පාඨමාලා 13 ක විෂය නිර්දේශයන් සංශෝධනය කර නොතිබුණි.

4.7 ආර්ථික නොවූ ගණුදෙනු

(අ) විශ්වවිද්‍යාලය විසින් 2013 වර්ෂය තුළ රු. 9,933,284 ක මුදලක් කොන්ත්‍රාත් සමාගමකට ගෙවා උද්‍යාන නඩත්තු සේවාව ලබාගෙන තිබියදී ශ්‍රම සැපයුම් සේවාව මගින් ලබාගත් ශ්‍රමිකයින් 15 දෙනෙකුද උද්‍යාන නඩත්තු සඳහා යොදවා සමාලෝචිත වර්ෂයයේදී රු. 631,900 ක් විශ්වවිද්‍යාල අරමුදලින් ගෙවා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා බදු ගැනීමට යෝජිත නිවාස ගොඩනැඟිලි වෙනුවෙන් 2011,2012 සහ 2013 වර්ෂයන්ට අදාල වන පරිදි තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වාර්තා නිකුත් කර ඇතත්, එම මාසික කුළී ප්‍රමාණයන් ඉක්මවා සියයට 200 දක්වා ඉහළ මිලකට නේවාසිකාගාර 14 ක් කුළී පදනමට ලබාගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 1,296,000 ක මුදලක් වැය කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය විසින් 2013 වර්ෂය වෙනුවෙන් ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා කුළී පදනම මත ලබාගත් නිවාස 34 ක මාසික කුළිය තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කර ගැනීමකින් තොරව නිවාස හිමිකරුවන් විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් පදනම් කරගෙන කුළී ගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේදී රු.16,296,000 ක් වාර්ෂික නිවාස කුළී ලෙස විශ්වවිද්‍යාල අරමුදලින් දරා තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 ක්‍රියාකාරි සැලැස්ම

2013 වර්ෂය වෙනුවෙන් සකස්කර තිබූ ක්‍රියාකාරි සැලැස්ම තුළ ලඟාකරගත යුතු භෞතික ඉලක්ක නිශ්චිතව දක්වා නොතිබීම හේතුවෙන් එම ක්‍රියාකාරි සැලැස්මට අනුකූලව විශ්වවිද්‍යාල කටයුතු මෙහෙයවා තිබුණේද යන්න පරීක්ෂා කිරීමට නොහැකි විය.

5.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකය 2002 වර්ෂයේදී ස්ථාපිත කර තිබුණු අතර 2002 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා විශ්වවිද්‍යාලයේ කටයුතු විශාල ලෙස පුළුල් වී තිබූ නමුත් එම කටයුතු සියල්ල ආවරණය කළ හැකි වන සේ අභ්‍යන්තර විගණන කාර්යය මණ්ඩලය සංශෝධනය කර නොතිබුණි. සහකාර අභ්‍යන්තර විගණක හා පරිගණක යෙදවුම් සහකාරවරයෙකු ඇතුළු 03 දෙනෙකු අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයට ඇතුළත් වී තිබුණද අධ්‍යයන කාර්යසාධනය පිළිබඳව අභ්‍යන්තර විගණන කටයුතු ඉටුකර නොතිබුණි.

5.3 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයන් 06 ක ඇස්තමේන්තුගත ආදායම සියයට 244 ක ඉක්මවීමක්ද ආදායම් විෂයයන් 05 ක ඇස්තමේන්තුගත ආදායම සියයට 58 ක ලඟා නොවීමක්ද නිරීක්ෂණය වූ අතර වැය විෂයයන් 19 ක වියදම ඉක්මවීම සියයට 91 ක්ද වැය විෂයයන් 20 ක වෙන්කළ ප්‍රතිපාදන ඉතිරිය සියයට 48 ක් විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර උපකුලපතිවරයා වෙත යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) මානව සම්පත් කළමනාකරණය
(ආ) ස්ථාවර වත්කම් පාලනය
(ඇ) කොන්ත්‍රාත් පාලනය
(ඈ) අයවැය පාලනය
(ඉ) වාහන පාලනය
(ඊ) ශිෂ්‍යසුබසාධන සේවා හා කොන්ත්‍රාත් පරිපාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

# 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය ප්‍රකාර 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව සම්බන්ධ විශ්වවිද්‍යාලය විසින් ගන්නා වූ ක්‍රියාමාර්ග පිළිබඳ පැහැදිලි කිරීම් හා නිවැරදි කිරීම්

**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාවේ දැක්වෙන කරුණු පිළිබඳ විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම**

1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106 (2) හා 1971 අංක 38 දරණ මුදල් පනතේ 107 (13) 7(ඒ) වගන්තිය ප්‍රකාර රජරට විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික ගිණුම් වාර්තා 2014 මාර්තු 31 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. එම වාර්ෂික ගිණුම් වාර්තාව සඳහා වූ විගණකාධිපති වාර්තාව 2015 ජනවාරි 23 දින ලැබී ඇති අතර ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ අදහස් දැක්වීම විගණන වාර්තාවේ අංක පිළිවෙල අනුව මේ සමග ඉදිරිපත් කරනු ලැබේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට පටහැනි වීම

ගිණුම්කරණ ප්‍රමිත අංක 1 ට අනුව ගිණුම් තැබීම නිවරැදි විය යුතු බව පිළිගන්නා අතර ඉදිරි වර්ෂ වලදි මෙවැනි තත්වයන් වළක්වා ගැනීමට කටයුතු කරණු ලැබේ.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

අ විශ්වවිද්‍යාලය සතු අක්කර 220 කට අධික ඉඩම් වල වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර තිබුණි. තක්සේරු වාර්ථා ලැබු පසු මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කරනු ලැබේ.

ආ මුදල් අයකර පවත්වාගෙන යන පාඨමාලා වලින් ලැබෙන මුදල් පාඨමාලා පවත්වාගෙන යාම වෙනුවෙන් වැයකරනු ඇත. එම මුදල් තාවකාලිකව බැංකු ස්ථිර තැම්පත්වල යෙදීම වෙනුවෙන් ලැබෙන පොලී මුදල් පාඨමාලාවල කටයුතු සඳහා යොදා ගනු ලැබේ.

ඇ වාර්ෂිකව පර්යේෂණ සඳහා විශ්වවිද්‍යාලය වෙත ලැබෙන අරමුදල් අනුමත කරනු ලබන ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කරණු ලැබේ. මෙම ව්‍යාපෘති ඉදිරියට වර්ෂ 2,3 දක්වා දීර්ඝ වන අවස්ථා ඇත. වෙන් කල ප්‍රතිපාදන කොටස් වශයෙන් නිදහස් කරනු ලැබේ. ඒ අනුව 2013 වර්ෂයේ ඒකාබද්ධ අරමුදලින් ලැබූ රු. 7,000,000 ක මුදල් ප්‍රතිපාදන හඳුනාගත් පර්යේෂණ ව්‍යාපෘති සඳහා ලබා දීමට වෙන් කර ඇති අතර ඉන් රු 4,183,432 ක් එම වර්ෂය තුළම වියදම් දරා ඇත. ඉතිරිය ඉදිරි වර්ෂ සඳහා ගෙන ගොස් ඇත.

ඈ 2013.12.31 දිනට ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී J/E 382 මගින් ගළපා නිවරැදි කර ඇත.

ඉ මෙම සටහන ගැළපීම සඳහා J/E 383 - 2014.09.30 දිනට සටහන් යොදා නිවරැදි කර ඇත.

### 2.2.3 නොසැසඳු පාලන

අ J/E 236 - 2014.9.30 මගින් නිවරැදි කර ඇත.

ආ ඉදිරි ගිණුම් වර්ෂ තුල නිවරැදි කර ඇත.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අ පශු සම්පත් භෞතික පැවැත්ම ලේඛනයක් සකස් කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ආ අදාළ විගණන විමසුමට පිළිතුරු ලබා දී ඇති එම පිළිතුරෙහි සඳහන් කරුණු විගණන රැස්වීම් තුළින් තව දුරටත් පැහැදිලි කරන ලදී.

### 2.3 ලැබිය යුතු ගිණුම්

අදාළ පර්යේෂණ අත්තිකාරම් ආපසු අයකරගෙන ඇත.

### 2.4 නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

අ පරිගණක ගත කරන ලද වත්කම් ලේඛණය 2015 වර්ෂය දක්වා යාවත් කාලීන කර ඇති අතර නිසි පරිදි පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. මෙහි ප්‍රගතිය විගණන කමිටු තුළින් නොකඩවා සාකච්චා කර ඇත.

ආ i 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනා ගන්නා ලද අපහරණය කළ යුතු සියලූ වත්කම් අපහරණය සඳහා පියවර ගෙන ඇත.

ii ධාවන සටහන් පොත් විගණනයට ඉදිරිපත් කර ඇත.

### 2.5 මතභේදයට තුඩුදෙන කරුණු

අ එකග නොවේ.

උප කුලපති නිළ නිවස වටා ආරක්ෂිත තාප්පය ඉදි කිරීම සඳහා උපදේශන සේවා සැපයූ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ඉදිරිපත් කළ මුල් ඇස්තමේන්තුව රු. 8,006,445.00 ක් වුවද එය ලේඛන ඇගයීමේ තාක්ෂණික ඇගයීම් කමිටුවට ඉදිරිපත් කළ පසු රු.මි.1.4 ක වටිනාකමකින් යුත් ආරක්ෂක

කුටියක් ඉදිකිරීම සහ වෙනත් ගණිතමය නිවැරදි කිරීම් නිර්දේශ කරමින් සංශෝධනයට ලක් කර ඇත. ඒ අනුව සංශෝධිත ඇස්තමේන්තුව රු. මි. 9.8 ක් වී ඇත. තවද ටෙණ්ඩර් කරුවන් විසින් සපුරාලිය යුතු මූලික සුදුසුකම් වන සාමාන්‍ය වාර්ෂික වැඩ වටිනාකම රු.මි. 25ක් විය යුතුය යන කොන්දේසිය සපුරා නොතිබීම මත අවම මිල ගනන් ඉදිරිපක් කළ ටෙණ්ඩර්කරුගේ ටෙණ්ඩරය ප්‍රතික්ෂේප වී ඇත. ඒ අනුව, සුදුදුකම් ලත් අවම මිල ගනන් ඉදිරිපත් කල ටෙන්ඩර්කරුට ටෙණ්ඩරය පිරිනමා ඇති අතර විශ්වවිද්‍යාලයට මූල්‍ය අලාබයක් සිදු වූවා යන්නට පිළිගනු නොලැබේ.

ආ එකග නොවේ.

මෙම ව්‍යාපෘතිය දැයට කිරුල කඩිනම් ව්‍යාපෘතියක් වශයෙන් ලැබූවකි. එම ව්‍යාපෘතියේ උපදේශක වශයෙන් කටයුතු කරන ලද්දේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවයි. ඒ සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට 5.5% ක ගෙවීමක් සිදු කර ඇත.

ඇ **එකග නොවේ.**

උපදේශන ආයතනය විසින් නිර්දේශකරන ලද ප්‍රමාද කාලය සඳහා ප්‍රමාද ගාස්තු අය කරනු ලැබේ.

3 **මූල්‍ය සමාලෝචනය**

3.1 මූල්‍ය ප්‍රතිඵලය

විගණන වාර්තාවේ දක්වා ඇති කරුණු නිවැරදි වේ.

4 **මෙහෙයුම් සමාලෝචනය**

4.1 අ විභාග ප්‍රතිඵල

i විගණන විසුමේ දක්වා ඇති කරුණු සමග එකග නොවේ.

දැනට ක්‍රියාත්මක වන්නේ සමාසික විභාග ක්‍රමයක් ය. එවිට එක් විෂයක් අසමත්වීම මත සමස්ත සමාසිකයම අසමත් වීමට හැකියාව ඇත. ඒ අනුව එම ශිෂ්‍ය ශිෂ්‍යාවන් විභාග අවශ්‍යතා සම්පූර්ණ නොකිරීම හේතුවෙන් උපාධිය පිරිනැමීමට සුදුසුකම් නොලබයි. තවද විභාගයට නොපැමිණීම, පැවරුම් භාර නොදීම ආදියද විභාගය අසම්පූර්ණ වීමට හේතු වේ. ඒ අනුව එවැනි හේතු මත විභාග අවශ්‍යතා සම්පූර්ණ නොකිරීම ඉහළ අසමත් ප්‍රතිශතයක් ලෙස සැලකිය නොහැක.

ii කතිකාචාර්යවරුන්ගේ හිගය හා ආධුනික කතිකාචාර්යවරුන් මත රඳා පැවතීම ආදී හේතූන් නිසා ප්‍රතිඵල ලබා දීමේ ප්‍රමාදයක් තිබුණද හැකි ඉක්මණින් ප්‍රතිඵල නිකුත් කිරීම අවසන් කර සැලසුම් ගත දිනවලදී උපාධි පිරිනැමීම සිදු කර ඇත.

iii ව්‍යවහාරික විද්‍යාපීඨයේ සහ කෘෂිකර්ම පීඨයේ විභාග පැවැත්වීමේ කටයුතු එම පීඨ මගින් සිදු කරණු ලැබේ. එබැවින් එම තොරතුරු අදාළ පීඨ මගින් විමසා ලබා ගත යුතු වන අතර විගණන නිළධාරීන් විසින් එම තොරතුරු ලබා ගෙන නැත. කෙසේ වුවද එම පීඨ වල කිසිදු කාල පමාවකින් තොරව විභාග ප්‍රතිඵල නිකුත් කර ඇත.

iv පිළිගනු ලැබේ.

(ආ) ඒක ශිර්ෂ පිරිවැය
විගණන වාර්තාවේ දැක්වෙන කරුණු සමග එකග වේ.

(ඇ) දේශන පැවැත්වීමේ ප්‍රගතිය

(i) එක් පීඨයන්හි විවිධ කතිකාචාර්යවරුන් විසින් පවත්වනු ලබන දේශන සම්බන්ධ වාර්තා පත්වාගෙන යාමට සියලුම අංශ ප්‍රධානීන් වෙත උපදෙස් ලබා දීමට පීඨාධිපති වරුන් විසින් කටයුතු කර ඇත. එම වාර්ථා මාසිකව මෙන්ම අර්ධ වාර්ෂික වශයෙන් සමාලෝචනය කරමින්ද සිසුන් වෙත, දේශන සහ දේශකයාගේ තත්වය සම්බන්ධ ප්‍රශ්නාවලියක් ලබා දීම මගින් ද ප්‍රගතිය විමර්ශනය කරනු ලැබේ. අදාළ ප්‍රගති සමාලෝචන වාර්ථා එක් එක් පීඨයන් වෙතින් ලබා ගත හැක.

(ii) 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ අධ්‍යයන කාර්ය සාධනය සම්බන්ධ ඉලක්කයන් පැහැදිලිව දක්වා තිබූ අතර වර්ෂ අවසානයේ ළගා කරගත් ඉලක්කයන් හා සැසදීමෙන් එම සැලසුම් ගත ඉලක්ක ලගා කර ගැනීම සම්බන්ධයෙන් ඇගයීමට හැකියාවක් ඇත.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) කාර්මික ඉංජිනේරුවරයාගේ නිර්දේශය අනුව අදාළ වෑන් රථය අලුත්වැඩියා කළ හැකි තත්වයේ නොපැවති අතර එය වෙන්දේසි කර විකිණීමට කටයුතු කර ඇත.

(ආ) මිහින්තලේ පරිශ්‍රයේ පවතින පොලිස් නිළ නිවාස පවරා ගැනීමට කටයුතු විශ්වවිද්‍යාලය ආරම්භයේ සිට කරණු ලැබුවත් තවම එම කටයුතු නිරවුල් වී නැත ඒ සඳහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලැබී

ඇති අතර පොලිස් දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා වට කිහිපයක් පැවැත්වුවද සමථයකට පත්වී නැත එබැවින් එම මුදල් තව දුරටත් විශ්වවිද්‍යාලය සතුව පවතී ඉදිරි වර්ෂ තුළදී මෙම කාර්යය සමථයකට පත් කර ගැනීමට හැකිවේ.

රජරට විශ්වවිද්‍යාලය අලුතින් ආරම්භ කරන ලද විශ්වවිද්‍යාලයක් වන අතර වාර්ෂිකව බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාවද ක්‍රමයෙන් ඉහළ යමින් පවතී. එම වැඩිවන ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව යටිතල පහසුකම් දියුණු වෙමින් පැවතියද මේ වන විටත් අභ්‍යන්තර ශිෂ්‍ය නේවාසිකාගාර ඉදිකිරීම් සම්පූර්ණ වී නොමැත. එබැවින් ශිෂ්‍ය නේවාසික පහසුකම් සඳහා බාහිර නිවාස කුලී පදනමට ලබා ගෙන ඇත. පොලිස් නිවාස පවතින ඉඩම යොදා ගැනීමට යෝජිත කාර්යය මණ්ඩල නිළ නිවාස ඉදි කිරීම් කටයුතු වෙනුවෙන් පොලිස් නිවාස පවරා ගැනීමේ කටයුතු සහ ශිෂ්‍ය නේවාසිකාගාර කුලී පදනමට ලබා ගැනීමත් අතර සම්බන්ධතාවයක් නැත.

(ඇ) ආපසු භාර නොදුන් පුස්තකාල පොත්

(i) සහ (ii) පොත් ආපසු ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත.

**4.3** **නිෂ්කාර්යය වත්කම්**

මෙම ගිණුම කළමණාකරණ පීඨයේ DEMP බාහිර පාඨමාලාව වෙනුවෙන් විවෘත කර ඇත. ඉදිරි කාලයේදී මෙම අරමුදල් භාවිතයට ගනු ඇත.

**4.4** **ප්‍රමාද වූ ව්‍යාපෘති**

ඉඩමේ නිරවුල් භුක්තිය මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේඛම් විසින් විශ්වවිද්‍යාලය වෙත 2014.10.27 වන දින විධිමත්ව භාර දී ඇත. වන්දි මුදල් ගෙවීම සඳහා ඇස්තමේන්තු කිරීමට අවශ්‍ය වන මිනින්දෝරු සැලසුම 2015.06.16 වන දින මිනින්දෝරු අධිකාරි විසින් ප්‍රාදේශිය ලේකම් ම.නු.ප වෙත යොමු කර ඇත.

4.5 **කාර්යය මණ්ඩල පරිපාලනය**

(අ) කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කර ඇත.

(ආ) කතිකාචාර්යවරුන් හට අධ්‍යයන නිවාඩු සහ සප්ත වාර්ෂික නිවාඩු ලබා ගැනීමට චක්‍රලේඛ ප්‍රකාර අයිතියක් පවතින අතර අධ්‍යයන කටයුතු වල නියැලීම සඳහා එසේ පශ්චාත් උපාධි කටයුතු වල නියැලීම සහ පර්යේෂණ කටයුතු වල නියැලීම අනිවාර්යය වේ. එබැවින් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් ඔවුනට අධ්‍යයන කටයුතු සඳහා නිවාඩු ලබා දීම අනුමත කරන අතර බාහිර කතිකාචාර්යවරුන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පුද්ගලයන් 109 දෙනකු මගින් ශ්‍රම සේවා ලබා ගෙන ගෙවීම් කර ඇත යනුවෙන් විගණන වාර්තාවේ දක්වා ඇතත් එමගින් අදහස් වනුයේ විටින් විට යොදවා ඇති පුද්ගලයින් නාමික වශයෙන් 109 දෙනකු පමණක් වන අතර තනතුරු 109 ක් නොවේයි. එබැවින් තනතුරු 109 ක් වෙත ගෙවීම් කර ඇත යන්න පිළිගනු නොලැබේ. ස්ථිර පදනමින් අනධ්‍යයන සේවකයන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති නමුත් පුරප්පාඩු සියල්ල සම්පූර්ණ කර නැති බැවින් වරින් වර ඇතිවන හදිසි උත්සව යනාදිය නිසා ඇතිවන ශ්‍රම අවශ්‍යතාවයන් බොහොමයක් මෙන්ම ගොවිපළ ශ්‍රම අවශ්‍යතාද වේ. වන තෙක් ස්ථිර සේවකයින් අනුමත කර නැති එහෙත් ශිෂ්‍ය මෙන්ම සේවක සුභ සාධන සේවා සැපයීම වෙනුවෙන් ස්ථාපිත කර ඇති දිවා සුරැකුම් මධ්‍යස්ථානය සංස්කෘතික මධ්‍යස්ථානය වෘත්තීය මාර්ගෝපදේශ මධ්‍යස්ථානය ආදියේ කටයුතු පවත්වාගෙන යාම සඳහාත් ශ්‍රම සැපයුම් මගින් සේවා ලබා ගෙන ඇත තවද රජයේ විගණන අංශය සඳහාද එසේ ශ්‍රමිකයින් සැපයීම සිදු කර ඇත.

**4.6 උපාධි පාඨමාලා රැකියා වෙළඳපොළට ඉලක්කගතව සංශෝධනය නොවීම**

විගණන විමසුමේ සඳහන් කරුණු සමග එකග නොවේ. පීඨයන්හි උපාධි පාඨමාලා රැකියා වෙළඳපළ අවශ්‍යතා අනුව වසර 5 කට වරක් සංශෝධනය කර ඇති අතර නව පාඨමාලා ආරම්භ කර ඇත.

**4.7 ආර්ථික නොවූ ගණුදෙණු**

(අ) උද්‍යාන නඩත්තු කොන්ත්‍රාත්තුව පිරිනමා ඇත්තේ නිශ්චිත කාර්යයක් පදනම් කර ගෙනය. එම පැවරූ කාර්යයන් වලට අමතරව යෙදෙන විශේෂ අවස්ථා වලදී (උපාධි ප්‍රධානෝත්සවය, සංස්කෘතික උළෙල වැනි) වෙනත් වැඩද සිදු කළ යුතුවේ. ඒ සඳහා ස්ථිර ශ්‍රමිකයන් නොමැති අතර ශ්‍රම සැපයුම් කොන්ත්‍රාත්කරු මගින් අතිරේක ශ්‍රමිකයින් ලබා ගන්නා ලදී.

(ආ,ඇ) රජරට විශ්වවිද්‍යාලය අලුතින් ආරම්භකරන ලද විශ්වවිද්‍යාලයක් වන අතර ශිෂ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව යටිතල පහසුකම් සම්පූර්ණයෙන් ස්ථාපිත වී නොමැති එබැවින් ශිෂ්‍ය නේවාසික පහසුකම් සඳහා අභ්‍යන්තර නේවාසිකාගාර ඉදිකිරීම් අවසන් කරන තෙක් බාහිර නිවාස කුලී පදනමට ලබා ගත යුතු වේ.ඒ සඳහා විශ්වවිද්‍යාලය විසින් පිළිගත් ටෙණ්ඩර් පටිපාටි අනුගමනය කරමින් පුවත්පත් දැන්වීම් පළකර තෝරා ගත් නිවාස හිමියන් ටෙණ්ඩර් මණ්ඩලයක් වෙත කැඳවා සාකච්ඡා කර ඉදිරිපත් කරන මිල ගණන් අවම මිල සහ ඒක ශිෂ්‍ය පිරිවැය පදනම් කර ගෙන සලකා බලා තෝරා ගෙන ඇත. තවද තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු වාර්තා ලබා ගැනීමට සැලකිය යුතු කාලයක් ගත වේ.එසේම තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ලබා දෙන තක්සේරු වටිනාකම් වලට නිවාස බදු දීමට නිවාස හිමියන් එකග නොවේ.

ඒ අනුව අභ්‍යන්තර නේවාසිකාගාර ස්ථාපනය කර අවසන් කරන තෙක් කුලී පදනම මත නිවාස ලබා ගැනීමට සිදුවනු ඇත.

5 ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

5.1 ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැලැස්ම තුළ එක් එක් අංශ මට්ටමින් ළඟා කර ගත යුතු ඉලක්ක වෙන් වෙන් වශයෙන් දක්වා ඇත. ඒ අනුව 2013 වර්ෂය තුළ ළඟාකර ගත යුතු ඉලක්කයන් විශ්වවිද්‍යාලය විසින් ළඟා කරගෙන ඇත.

5.2 අභ්‍යන්තර විගණනය

2015 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන අංශයේ සේවක මණ්ඩලය වැඩි කර විගණන කටයුතු පුළුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

5.3 අයවැය ලේඛනමය පාලනය

කළමනාකරණ පාලන ක්‍රමයක් ලෙසට යොදා ගැනීමට කටයුතු කරනු ලැබේ.

6 පද්ධති හා පාලනයන්

වාර්තාවේ පෙන්වා දී ඇති ස්ථාවර වත්කම් පාලනය, කොන්ත්‍රාත් පාලනය, අයවැය පාලනය, මානව සම්පත් කළමනාකරණය, වාහන පාලනය සහ ගිවිසුම්ගත සේවා කොන්ත්‍රාත් පරිපාලනය කෙරෙහි අවධානය යොමුකර කටයුතු කරණු ලැබේ.

මහාචාර්ය රංජිත් විජයවර්ධන
උපකුලපති

මහාචාර්ය රංජිත් විජයවර්ධන
උපකුලපති
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
මිහින්තලේ